# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## කෘෂි හා ආහාර තාක්ෂණය - II

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 2 යි

★ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) වියළි කලාපයට යල් කන්නයේ දී වගා කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස වැසි නොලැබෙන නිසා කුඹුරුවල කොටසක වී වගාව සඳහාත් ඉතිරි කොටසේ අතිරේක ආහාර බෝග වගා කිරීමටත් කන්න රැස්වීම් වලදී තීරණය කරන ලදි.

i. (a) යල කන්නයට අයත් කාලසීමාව දක්වන්න.
(b) යල කන්නයට වැසි ලැබෙන ප්‍රධාන ක්‍රමය කුමක්ද?

ii. (a) වියළි කලාපයේ ප්‍රධාන වශයෙන් ව්‍යාප්තව ඇති පස් කාණ්ඩය නම් කරන්න.
(b) එම පසේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

iii. (a) මඩ වී වගාව සඳහා බිම් සකස් කිරීමේ පියවර දෙකක් ලියන්න.
(b) යල කන්නයට සුදුසු වයස මාස 3 - 3 ½ කාණ්ඩයට අයත් වී ප්‍රභේද දෙකක් නම් කරන්න.

iv. (a) ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා ගොයම් පැළ ලබා ගැනීමට සකස් කරන ගත හැකි තවාන් වර්ග දෙකක් ලියන්න.
(b) වී වගාවේ බහුලව දැකිය හැකි තෘණ වර්ගයට අයත් වල් පැළෑටි දෙකක් නම් කරන්න.

v. කුඹුරු ඉඩම්වල වගා කළ හැකි
(a) ෆැබේසියේ කුලයට අයත් බෝග වර්ග දෙකක්
(b) සොලනේසි කුලයට අයත් බෝග වර්ග දෙකක් නම් කරන්න.

vi. (a) වී වගාව සඳහා වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.
(b) මෙම ක්‍රමයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

vii. (a) වී වගාව සඳහා යෙදිය හැකි කාබනික පොහොර වර්ග දෙකක් නම් කරන්න.
(b) පසේ ජල සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ක්‍රම දෙකක් යෝජනා කරන්න.

viii. (a) වී වගාවේ මතුපිට පොහොරක් ලෙස භාවිතා කරන බණ්ඩි පොහොරවල අඩංගු ප්‍රධාන පෝෂක දෙකක් නම් කරන්න.
(b) ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණය කෙටියෙන් හඳුන්වන්න.

ix. වී වගාවේ දී බහුල ලෙස පළිබෝධ නාශක භාවිතා වේ. පළිබෝධනාශක භාවිතයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් හතරක් සඳහන් කරන්න.

x. පළිබෝධ පාලනය සඳහා භාවිතා කළ හැකි පරිසර හිතකාමී පළිබෝධනාශක වර්ග හතරක් නම් කරන්න.

02)බෝග වගාවෙන් සාර්ථක අස්වනු ලබා ගැනීමට පරිසර හා පාංශු සාධක විශාල බලපෑමක් ඇති කරයි.

i.

a) සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගාවට ඇති කරන හිතකර හා අහිතකර බලපෑම් දෙක බැගින් ලියන්න.

b) ප්‍රභා අවධි සංවේදිතාවය යන්න හඳුන්වන්න.

c) දිගු දින බෝග වර්ග දෙකක් නම් කරන්න.

ii.

a) පහත දැක්වෙන උපකරණ භාවිතයෙන් මනිනු ලබන කාලගුණික සාධකය හා එහි ඒකක දක්වන්න.

| | උපකරණය | කාලගුණ සාධකය | ඒකකය |
|---|---|---|---|
| 1 | අනිලමානය | | |
| 2 | සූර්ය විකිරණමානය | | |
| 3 | තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය | | |

b) උෂ්ණත්වය බෝග වගාවට ඇති කරන හිතකර බලපෑම් හතරක් ලියන්න.

iii. (a) පාංශු වයනය කෘෂිකාර්මික කටයුතු වලදී වැදගත් වන ආකාර දෙකක් සඳහන් කරන්න.

(b) පාංශු භායනය ඇතිවීමට බලපාන හේතු තුනක් ලියන්න.

03)බෝග අස්වනුවල ගුණත්මය, ප්‍රමාණාත්මක බව මෙන්ම නිෂ්පාදන වියදම ඉහළ යාමට ද පලිබෝධ හානි හේතු වේ.

i. (a) බෝගයට වල් පැළෑටි වලින් සිදුවන හානි තුනක් ලියන්න.

(b) වල් පැළ පාලනයට යොදා ගන්නා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම හතරක් සඳහන් කරන්න.

ii. (a) බෝගයකට රෝග ඇති වීමට බලපාන සාධක රෝග ත්‍රිකෝණය ඇසුරෙන් දක්වන්න.

(b) තවාන් පැළ වලට බහුලව වැළදෙන දියමලන් කෑමේ රෝගයේ

- රෝග කාරකයා
- රෝග ලක්ෂණ
- පාලන ක්‍රම දක්වන්න.

iii. කුකර්බිටේසියේ කුලයේ බෝග අස්වනු වලට ප්‍රබල ලෙස හානි කරන ඉල්මැස්සා පාලනයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ඉදිරිපත් කරන්න.

04)"අහසින් වැටෙන එක දිය බිඳුවක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහා මුහුදට ගලායාමට ඉඩ නොතැබිය යුතුයි." ලෙස ප්‍රකාශ කළ හෙළ රජදරුවන් එය ක්‍රියාවට නගමින් මහ මුහුද පරයන මහ වැව් ඉදිකළේය.

i. (a) වැවක ප්‍රධාන අංග හතරක් නම් කරන්න.

(b) පසෙන් ජලය ඉවත් වන ක්‍රම තුනක් ලියන්න.

ii. (a) බෝගයට සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු කරුණු තුනක් දක්වන්න.

(b) බිංදු ජල සම්පාදනයේ වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

iii. (a) ජලවහන ක්‍රම තුනක් නම් කරන්න.

(b) ජලවහන කාණු රටා දෙකක් නම් කර එක් ක්‍රමයක් රූප සටහනක් ඇද නම් කර දක්වන්න.

05) බෝග වගාවේදී බීජ ප්‍රධාන රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා උවත් වර්ධක ප්‍රචාරණ ක්‍රමද භාවිතයට ගනියි.

i. (a) බීජ සුප්තතාවය යනු කුමක්ද?

(b) බීජ සුප්තතාවයට බලපාන හේතු හතරක් සඳහන් කරන්න.

ii. (a) සහතික කළ බිත්තර වී වල පැවතිය යුතු ප්‍රමිතීන් තුනක් දක්වන්න.

(b) බීජවල පැළවීමේ ශක්තිය පරීක්ෂා කරනු ලබන ක්‍රම තුනක් නම් කර එක් ක්‍රමයෙන් කෙටියෙන් විස්තර කරන්න.

iii. (a) වර්ධක ප්‍රචාරණයේ වාසි තුනක් ලියන්න.

(b) පැලුම් රිකිලි බද්ධය සිදුකරන ආකාර නම් කළ රූප සටහන් මඟින් දක්වන්න.

06) සංවර්ධනය වෙමින් පවතින රටවල ගොවීන් නිෂ්පාදනය කරනු ලබන කෘෂි නිෂ්පාදන වලින් 20 - 40%ක ප්‍රමාණයක් පසු අස්වනු හානි හේතුවෙන් අපතේ යන බව සොයා ගෙන ඇත.

i. (a) පසු අස්වනු හානිවලට බලපාන පෙර අස්වනු සාධක තුනක් ලියන්න.

(b) පසු අස්වනු හානිවලට හේතුවන පසු අස්වනු සාධක තුනක් දක්වන්න.

ii. (a) පසු අස්වනු හානි අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

(b) පහත වගුවේ දක්වා ඇති බෝග අස්වනු නෙලීමට සුදුසු අවස්ථාව තීරණය කරන ලක්ෂණ සඳහන් කරන්න.

| | බෝගය | නෙලීමට සුදුසු අවස්ථාව තීරණය කරන ලක්ෂණ |
|---|---|---|
| 1 | කෙසෙල් | |
| 2 | අඹ | |
| 3 | ගස්ලබු | |
| 4 | බණ්ඩක්කා | |

iii. (a) අස්වනු ප්‍රවාහනයේ දී සිදුවන හානි අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.

(b) අස්වනු ගබඩා කරනු ලබන ගබඩාවක පැවතිය යුතු ප්‍රසස්ථ තත්ත්වයන් තුනක් සඳහන් කරන්න.

07) අතිරික්ත කෘෂි නිෂ්පාදන අනාගතයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒවා නරක් නොවී තබා ගැනීමට විවිධ පරිරක්ෂණ ක්‍රම යොදා ගනියි.

i. (a) ආහාර නරක්වීමට බලපාන හේතු තුනක් නම් කරන්න.

(b) ප්‍රධාන ආහාර පරිරක්ෂණ ක්‍රම තුනක් නම් කර නිදසුනක් බැගින් ඉදිරිපත් කරන්න.

ii. (a) ආහාර පරිරක්ෂණයේ වැදගත්කම් හතරක් ලියා දක්වන්න.

(b) ආහාර ප්‍රබල කිරීම යනු කුමක්දැයි හඳුන්වා නිදසුනක් ඉදිරිපත් කරන්න.

iii. (a) ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන පෝෂණ ගැටලු තුනක් සඳහන් කරන්න.

(b) මෑතකාලීනව ළමා මන්දපෝෂණය ප්‍රබල සෞඛ්‍යය ගැටලුවක් බවට පත්ව ඇත. ළමා මන්දපෝෂණයට බලපාන හේතු තුනක් ලියන්න.